උපාධි ප්‍රදානෝත්සවය 2009

කෘෂිකර්ම විද්‍යා පීඨය

රුහුණ විශ්වවිද්‍යාලය සතු පැරණිතම පීඨ අතරින් එකක් වන කෘෂිකර්ම විද්‍යා පීඨය කඹුරුපිටිය මාපලාන ප්‍රදේශයේ පිහිටා ඇත. අධ්‍යයනාංශ 07කින්, අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 60කින් සමන්විත මෙම පීඨය යටතේ ශිෂ්‍යයන් 600ක් ද, පශ්චාත් උපාධි අපේක්ෂකයන් 250ක් ද අධ්‍යාපන කටයුතු කරති.

වර්තමානය වන විට පීඨය මගින් කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය පිරිනමනු ලබන අතර ඊට අමතර ව පශ්චාත් උපාධි 5 ක් පිරිනමනු ලබයි. තවද හරිත තාක්ෂණය සහ භෝග නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය මූලික පියවර මේ වනවිටත් ගෙන ඇත.

සාමූහික පර්යේෂණ වැඩසටහන් මගින් පීඨය හා එහි සාමාජිකයන් දේශීය හා විදේශීය සංවිධාන සමඟ ශක්තිමත් සබඳතා ගොඩනගා ගැනීමට ද සමත් වී ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ බොහෝ සාමාජිකයින් විසින් සිදු කරන ලද පර්යේෂණ විවිධ සම්මානවලින් පිදුම් ලැබ ඇත. නවෝත්පාදන හා නව නිපැයුම් සඳහා පුළුල් ඉතිහාසයකට හිමිකම් කියන පීඨයේ බොහෝ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ උපකුලපති සම්මාන හා ජනාධිපති සම්මාන වැනි විශිෂ්ට ඇගයීම්වලට පවා භාජනය වී ඇත්තාහ.

විවිධ වූ අභියෝගයන්ට මුහුණ දීමට හැකිවන පරිදි ශිෂ්‍යයන් තුළ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා හිතකර ඉගෙනුම් පරිසරයක් පවත්වා ගැනීම හරහා කෘෂිකාර්මික උසස් අධ්‍යාපනයේ ගුණාත්මය, පර්යේෂණ කටයුතු, උපදේශනය හා වෘත්තීමය කටයුතු කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් වර්තමානය වන විට පීඨය කටයුතු කරයි. ඒ මගින් රටෙහි විද්‍යාත්මක, තාක්ෂණික, සමාජීය හා ආර්ථිකමය සංවර්ධනය සඳහා ද පීඨය තම දායකත්වය සපයයි.

ඉංජිනේරු පීඨය.

රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය හපුගල, ගාල්ල ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත. මෙය ප්‍රධාන විශ්වවිද්‍යාල භූමියෙන් කිලෝ මීටර් 50ක දුරින් පිහිටා ඇත. 2000.01.08 වන දින මෙම පීඨය විවෘත කළ අතර පළමු ශිෂ්‍ය කණ්ඩායම 2000.03.27 දින බඳවා ගත් අතර, එදින සිට මෙහි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ තුන්වන ඉංජිනේරු පීඨය වන රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය මේ වන විට පාඨමාලා ඒකක ක්‍රමය යටතේ පූර්ණකාලීන උපාධි පිරිනමයි. වාර්ෂික ව සිසුන් 200 ක් බඳවා ගන්නා අතර මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති මත තීරණය වේ. ඉංජිනේරු පීඨයේ ප්‍රධාන ඉලක්කය වනුයේ රටකට කුසලතාවලින් පරිපූර්ණ වූ ඉංජිනේරුවන් බිහි කිරීමයි. ඉංජිනේරු පීඨය යටතේ අධ්‍යයනාංශ හතරක් ක්‍රියාත්මක වේ.

ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය.

මෙම පීඨය මගින් වර්තමානය වන විට ධීවර හා සාගර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය පිරිනමනු ලබන අතර එය වසර 04 ක කාලසීමාවක් සහිත විශේෂවේදී උපාධි පාඨමාලාවකි. පීඨය සතු අධ්‍යයනාංශ මගින් මෙහෙයවනු ලබන පාඨමාලා ඒකක රාශියකින් මෙම උපාධි පාඨමාලාව සමන්විත වේ.

රුහුණ විශ්වවිද්‍යාලය සතු ලාබාලතම පීඨය වන මෙම පීඨයේ වාර්ෂික ශිෂ්‍ය ධාරිතාවය සිසුන් 60 දෙනෙකුට සීමා වන අතර අධ්‍යයනාංශ 3 න් සමන්විත වේ.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය.

වර්ෂ 1978 දී රුහුණ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය පිහිටුවීමත් සමඟම මෙම පීඨය ද ආරම්භ කරන ලදී. මුලදී කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධව ඇරඹූ මෙම පීඨය පසුව විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්වීමත් සමග ස්වාධීන පීඨයක් ලෙස තම අධ්‍යයන කටයුතු අරඹන ලදී.

වර්තමානය වන විට විවිධ වූ විෂය ක්ෂේත්‍ර යටතේ ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි පිරිනමනු ලබන පුළුල් පීඨයක් ලෙස කටයුතු සිදු කරනු ලබයි.

විශ්වවිද්‍යාලය තුළ වර්තමානය වනවිට විශාලතම සිසුන් පිරිසකට අධ්‍යාපනය ලබාදෙන පීඨය ලෙස මෙම පීඨය හඳුන්වා දිය හැකි අතර පීඨයට අනුබද්ධව කටයුතු කරන අධ්‍යයනාංශ ප්‍රමාණය 07කි.

වත්මන් රැකියා වෙළෙඳ පොළේ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ශිෂ්‍යයන්ගේ තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන හැකියාවන් ඔප්නැංවීම සඳහා පරිසනක මධ්‍යස්ථානයක් ද පීඨය මගින් ස්ථාපිත කරන ලදි. එසේම ලෝක බැංකු ආධාර යටතේ IRQUE ව්‍යාපෘතිය මගින් පරිසණක හා ඉංග්‍රීසි භාෂා සඳහා විශේෂිත වැඩසටහන් 2ක් ද ක්‍රියාත්මක කෙරේ. සංස්කෘතික කටයුතු හා දක්ෂතා දියුණු කරවීම සඳහා පීඨය මගින් සංස්කෘතික කේන්ද්‍රයක් ද පවත්වාගෙන යනු ලබයි. එසේම පීඨය මගින් මෙහෙයවනු ලබන නූතන භාෂා හා ශිෂ්ටාචාර මධ්‍යස්ථානය ශිෂ්‍යයන්ට තම මව් භාෂාවෙන් ඔබ්බට යමින් භාෂා කුසලතා වැඩිදියුණු කර ගැනීමට ද අවස්ථාව ලබා දේ.

මෙම පීඨය සතු ව පවතින ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මගින් අභ්‍යන්තර සිසුන් සඳහා සෑම අධ්‍යයන වර්ෂයක ම ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වනු ලැබේ. කළමනාරණ හා මූල්‍ය පීඨය සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය හැර අනෙකුත් පීඨවලට ඇතුලුවන නවක සිසුන්ට කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වනු ලබයි. ඊට අමතරව බාහිර පාඨමාලාවක් ලෙස රැකියා නියුක්තිකයන් සඳහා සහතික පත්‍ර පාඨමාලාවක් හා ඩිප්ලෝමා පාඨමාලාවක් ද පවත්වනු ලබයි.

කළමනාකරණ හා මූල්‍ය පීඨය

21 වන සියවසේ කළමනාකරණ ක්ෂේත්‍රයට වෘත්තීය කළමනාකරුවන් බිහි කිරීමේ අරමුණින් 2003 අප්‍රේල් 29 වන දින කළමනාකරණ හා මූල්‍ය පීඨය රුහුණ විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කරන ලදි. මෙයට ප්‍රථමයෙන් ව්‍යාපාර පරිපාලනවේදී හා වාණිජවේදී උපාධි මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය යටතේ පැවති ව්‍යාපාර පරිපාලනවේදී අධ්‍යයන අංශය මගින් ප්‍රදානය කෙරිණි. වර්තමානයේ පීඨය මගින් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හා පශ්චාත් උපාධි පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි.

ගිණුම්කරණ හා මූල්‍ය, කළමනාකරණ හා ව්‍යවසායකත්ව හා අලෙවි කළමනාකරණ වශයෙන් අධ්‍යයනාංශ තුනක් පීඨය යටතේ ක්‍රියාත්මක වේ. මෙම අධ්‍යයන අංශ තුන යටතේ ගිණුම්කරණ, අලෙවි කළමනාකරණ, මානව සම්පත් කළමනාකරණ, ව්‍යවසායකත්ව යන විශේෂධ්‍යයන විෂය ක්ෂේත්‍ර යටතේ උපාධි ප්‍රදානය කෙරේ. මෙයට අමතර ව විද්‍යාර්ථීන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම උදෙසා පරිගණක අධ්‍යයන අංශයක් ද ක්‍රියාත්මක වන අතර පාඨමාලා ඒකක ක්‍රමය යටතේ අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක වේ. සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම උදෙසා ක්ෂේත්‍ර චාරිකා උපයෝගී වන අතර තම න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික වශයෙන් යොදාගැනීම සඳහා සය මසක සීමාවාසික පුහුණුවක් ද ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාවට ඇතුළත් වේ. පර්යේෂණ හා ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සඳහා පීඨය මගින් ඉහළ දායකත්වයක් ලබා දී ඇත.

වෛද්‍ය පීඨය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ව ගාල්ල රෝහල් පරිශ්‍රයේ දී 1980 ජූලි මස වෛද්‍ය පීඨය ආරම්භ කෙරිණි. 1983 වර්ෂයේ දී පීඨය වර්තමානයේ පවතින ගාල්ල කරාපිටිය ප්‍රදේශයට ගෙන යන ලදි. වර්තමානයේ පීඨය විසින් වසර 5 වෛද්‍ය උපාධිය සහ පශ්චාත් උපාධි පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි. මේ වන විට අධ්‍යයන අංශ 14ක් පීඨය යටතේ ක්‍රියාත්මක වේ.

පීඨය මගින් වසරකට වෛද්‍ය උපාධිධාරීන් 130ක් පමණ බිහි කරනු ලබන අතර වර්තමානය වන විට විද්‍යාවේදී හෙද උපාධිය හා විද්‍යාවේදී රසායනාගාර විද්‍යා උපාධිය යන සම සෞඛ්‍ය උපාධි 2ක් ද පිරිනමනු ලබයි. එසේම පර්යේෂණ හා සමාජීයීය කටයුතුවලට ද පීඨය සක්‍රීය දායකත්වයක් ලබාදේ.

විද්‍යා පීඨය.

මාතර මැද්දවත්ත කාර්මික විද්‍යාලයීය ගොඩනැගිලි පරිශ්‍රයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ව 1978 දී විද්‍යා පීඨය ආරම්භ කරන ලදී. 1984 පෙබ.01 දින සිට රුහුණ විශ්වවිද්‍යාලයට ම ආවේණික ව නව ගොඩනැගිලි පහසුකම් ද සහිත ව රුහුණ විශ්වවිද්‍යාලය වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ දී නැවත ස්ථාපිත කරන ලදි.

උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව හා සත්ත්ව විද්‍යාව යන අධ්‍යයනාංශවලින් විද්‍යා පීඨය සමන්විත ව ඇත. ඊට අමතර ව පරිගණක ඒකකය ද පීඨය තුළ විවිධ අවශ්‍යතාවන් සපුරාලයි.

විද්‍යාවේදී සාමාන්‍ය (අවු.03) හා විද්‍යාවේදී විශේෂ (අවු.04) උපාධි මෙම පීඨයෙන් පිරිනැමේ. එක් එක් අධ්‍යයනාංශ මගින් සපයන පාඨමාලා ඒකක හරහා උපාධි වැඩසටහන ක්‍රියාත්මක වේ. පරිගණක විද්‍යා අධ්‍යයනාංශය මගින් පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. පරිගණක ඒකකය මගින් පරිගණක තාක්ෂණය හා සාක්ෂරතාවය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලා මෙහෙයවනු ලබයි.